// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2034/38 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 4/81(XII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23 ද වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙම නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කටයුතු තහනම් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලිස්ටයරින් වලින් ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප හා හැඳි නිෂ්පාදනය ; සහ

(ii) ප්‍රසාරිත පොලිස්ටයරින් වලින් නිෂ්පාදිත ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප සහ හැඳි රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මෙම නියමයේ කාර්ය සඳහා-

''ආහාර ඇසුරුම් පෙට්ටි'' යන්නෙන්, ආහාර බහාලන පෙට්ටි (Lunch Boxes) අදහස් වේ.

09-366

1A - PG 3681 — 5007 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*